**ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය - 2022**

-----------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මාණ්ඩලික විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මාණ්ඩලික විද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මාණ්ඩලික විද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මාණ්ඩලික විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මාණ්ඩලික විද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මාණ්ඩලික විද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මාණ්ඩලික විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මාණ්ඩලික විද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මාණ්ඩලික විද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

| විගණන නිරීක්ෂණය | කලමණාකාරිත්වයේ අදහස් අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු. 16,696,210 ක් වටිනාකම වූ ජර්නල් සටහන් 13 ක නිවැරදිතාවය පිළිබඳව ගණකාධිකාරී විසින් සහතික කර නොතිබුණු අතර ජර්නල් වවුචර්ද පිළියෙල කර නොතිබුණි. | පොදු ජ'නලය හරහා සටහන් තැබිය යුතු ගිණුම්කරණ ගැලපීම් සියල්ල එක් එක් ශීර්ෂය යටතේ වෙන වෙනම ජ'නල් සටහන් තබා ගණකාධිකාරී විසින් අත්සන් කර ගිණුම් පිරික්සුම් ලැයිස්තුව වෙත ඇතුලත් කර ඇත. එම ජ'නල් සටහන් වලට අදාළ සියලුම ලේඛණ සහ ලිපි ගොනු විද්‍යාලයේ ගිණුම් අංශය තුල නඩත්තුකරනු ලබයි. | ජර්නල් සටහනක් සඳහා ජර්නල් වවුචර් සකස් කල යුතු වීම. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කලමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රජයේ ප්‍රදාන යටෙත් මිලදී ගෙන ඇති දේපල පිරියත හා උපකරණ වලට අදාල රු.1,920,362 ක ක්ෂය වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 20ට පටහැනිව සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම හා විලම්භිත ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | එම වැරදි ජ'නල් සටහන් මඟින් සමුච්චිත අරමුදල හරහා 2023 මැයි මස නිවැරදි කිරීමට කටයුතු කරනු ලබයි. | වත්කම් වල ක්ෂය වීම් නිවැරදිව ගණනය කර ගිණුම්ගත කල යුතු වීම. |
| (ආ) සේනාවිධායක සමුගැනීමේ සාදය වෙනුවෙන් ගෙවන ලද රු.307,828 ක් විද්‍යාලයේ සංග්‍රහ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු අවම කර ගැනීමට කටයුතු කරමි. | රජයේ මුදල් ඉතා සකසුරුවම් ලෙස විද්‍යාලයේ අරමුණු වෙනුවෙන් වැය කල යුතු වීම. |
| (ඇ) පෙර වර්ෂයේ අඩුවෙන් ගිණුම්ගත කරන ලද රු.249,750 ක පාරිතෝෂික දීමනා නිවැරදි කිරීමේදි සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික ගිණුමට හර කර තිබීම නිසා පාරිතෝෂික වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් නිරූපනය වී තිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු අවම කර ගැනීමට කටයුතු කරමි. | පෙර වර්ෂයේ වැරදි නිවැරදි කිරීම් සමුච්චිත අරමුදල මඟින් නිවැරදි කල යුතු වීම. |
| (ඈ) එකතුව රු.2,293,012 ක් වූ දේශන ගාස්තු,සංග්‍රහ වියදම් හා සිතියම් මිලදී ගැනීමේ වියදම් උපචිත වියදම් ලෙස හදුනාගෙන නොතිබුණි. | 2022.12.31 දිනට පසුව ගෙවීම් කිරීම සඳහා එක් එක් ආයතන වෙතින් ඉදිරිපත් කරන ලද වවුචර්පත් බැවින් උපචිත | වර්ෂයට අදාල උපචිත වියදම් හදුනාගෙන ගිණුම්ගත කල යුතුවීම. |

පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම්ගත කිරීමට නොහැකි වී ඇත.

## 1.6 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම

| නීති, රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කලමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1980 අංක 46 දරන සේවා නියුත්තිකයන්ගේ භාර අරමුදල් පනත | විද්‍යාලයේ සිවිල් කාර්ය මණ්ඩලය වෙනුවෙන් 2009 වර්ෂයේ සිට 2022 අගෝස්තු 31 දක්වා දායක මුදල් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙත ගෙවා නොතිබුණි. දැනට සේවයේ නියුතු සේවකයන් 64 දෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතු දායක මුදල රු.7,583,786 විය. | 2009 වර්ෂයේ සිට 2022.08.31 දින දක්වා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල වෙත දායක මුදල් බැර කිරීමක් සිදුකර නොමැත. කම්කරු දෙපාර්තමේන්තුවෙන් ලැබෙන උපදෙස් මත ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා සිටිනු ලැබේ. | සේවා නියුත්තිකයන්ගේ භාර අරමුදල් පනතේ නියමයන් අනුව කටයුතු කල යුතුවීම. |
| (ආ) මුදල් රෙගුලාසි 94 (1) | වාර්ෂික බැරකම්, ඇස්තමේන්තු වල ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිම දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවාවක් සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳී සිටිය යුතුය. එසේ වුවත් රු.1,200,400 ක වියදම් ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට එළැඹ තිබුණි. | 2022 වර්ෂය තුල පැවති අධික උද්ධමනකාරී වාතාවරණය හේතුවෙන් සියලුම භාණ්ඩ හා සේවාවන්හි මිල ගණන් ඉහළ යාම හේතුවෙන් ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම් වලට එළඹී ඇත. | මුදල් රෙගුලාසි සහ මුදල් ප්‍රතිපාදන අනුව කටයුතු කල යුතුවීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 86,736,631 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 28,959,510 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 57,777,121 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂ මෙහෙයුම් වියදම් රු.19,059,686 කින් වැඩිවීම ඉක්මවා විදේශ ශිෂ්‍යාන්ගෙන් ලද ආදායම රු. 41,212,423 ක් සහ ඒ මත ලැබුණු විනිමය ලාභය රු.31,560,311 කින් වැඩි වීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කලමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රටේ පවතින අර්බුදකාරි තත්ත්වය සමඟ මහා භාණ්ඩාගාරය විසින් වියදම් සීමා කිරීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛයන්ට පටහැනිව මාණ්ඩලික විද්‍යාලයේ කටයුතු පරීක්ෂා කිරීම සඳහා ආරක්ෂක ලේකම්, ආරක්ෂක මාණ්ඩලික නිලධාරි, ත්‍රිවිධ හමුදාපතිවරුන්ගේ පැමිණීම වෙනුවෙන් දින 5 ක් සඳහා රු.1,144,658 ක සංග්‍රහ වියදමක් දරා තිබුණි. | දකුණු ආසියාවේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරි පුහුණු පාසලක් වන මෙම විද්‍යාලයේ අධ්‍යන කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා සෑම වසරක් පාසාම ත්‍රිවිධ හමුදාපතිවරුන් සහ ආරක්ෂක ලේකම්තුමා පැමිණෙනු ලබයි. ඒ සඳහා වැය දැරීම් වෙනුවෙන් කිසිදු අරමුදලක් මෙම විද්‍යාලයේ නොමැති බැවින් සංග්‍රහ වියදම් වැය ශීර්ෂය යටතේ පසුගිය වසරවල් වලදී මෙන්ම 2022 වසරේදි ද එම වියදම් දැරීමට සිදුවී ඇති බැව් කාරුණිකව දන්වා සිටිමි. එහෙත් විගණන කමිටුව විසින් නිර්දේශිත කරුණු මින් ඉදිරියේදි බලාත්මක කිරීමට හා 2022.04.06 දිනැති අංක 03/2022 දරණ ජාතික අයවැය චක්‍ර ලේඛණය මඟින් පෙන්වා ඇති වියදම් පාලනය කිරීමට දැනටමත් ක්‍රියාකර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | අදාල චක්‍රලේඛ ප්‍රතිපාදනයන් ට අනුව කටයුතු කල යුතු වීම. |

### 3.2 කළමණාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කලමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| හෙයියන්තුඩුව තරුණ සේවා සභාවට අයත් අක්කර 11 ක ඉඩම තුල විද්‍යාලය විසින් ගොඩනැගිලි ඉදිකර ඒවා භාවිතයට ගනිමින් පැවතියද එම ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් පවරාගෙන නොතිබුණි. | අක්කර ක භූමි 10 පර්චස් 11 තිසංස්කරණ මාණය ඉඩම් ප්‍රප්‍ර කොමිෂන් සභාව වෙත පවරාගෙන ඇති අතරමාණය එම භූමි ප්‍ර , ලය වෙත පවරා ගැනීමේ විද්‍යා තක්සේරු කටයුතු සඳහා ගම්පහ කාර්යාලය වෙතින් තක්සේරු ධාන තක්සේරු කටයුතු සිදුකර ප්‍ර කාර්යාලය කොළඹ වෙත අනුමැතිය එම ,සඳහා ඉදිරිපත් කර ඇති අතර තිසංස්කරණ අනුමැතිය ඉඩම් ප්‍ර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ඉඩම පැවරීමේ කටයුතු සිදුකරන බව දන්වා ඇත. | ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරා ගත යුතුවීම. |

### 3.3 මතභේදයට තුඩු දෙන ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | කලමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2022 ඔක්තෝබර් 11 දින විද්‍යාලයේ අවශ්‍යතා සඳහා ඡායාරූප යන්ත්‍රයක් විද්‍යාලයේ ආයතන සභාපති අරමුදල (විආස) මගින් මුදල් ගෙවා මිලදී ගෙන පසුව එම අරමුදල වෙත | කැමරාව මිලදී ගැනිම සඳහා ප්‍රසම්පාදන මාර්ග උපදේශ සංග්‍රහයට අනුව මිලගණන් විවෘත කිරීමෙන් පසු . ඒ අනුව තාඇක වෙතින් එවකට පැවති වෙළඳපල | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව භාණ්ඩ මිලට ගැනීමට කළ යුතුය.කූට ලේඛණ සැකසීම පිළිබඳ ආයතන සංග්‍රහයේ දෙවන |

| | | |
|---|---|---|
| ප්‍රතිපූර්ණය කර තිබුණි. විආස අරමුදලින් රු.1,186,480 ක මුදලක් ලබාගෙන භාණ්ඩ මිලදී ගැනීමෙන් අනතුරුව 2022 නොවැම්බර් 08 වන දින ලංසු කැඳවා ප්‍රසම්පාදන කටයුතු සිදු කල පසුව ලිපි ගොනුව සකස් කර තිබුණි. ඒ අනුව විද්‍යාලය විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව මෙම ඡායාරූප යන්ත්‍රය මිලදී ගැනීමෙන් අනතුරුව ව්‍යාජ හා කූඨ ලේඛන සකස් කර ඇති බවත් ඊට අනුබල ලබාදී ඇති බවත් හෝ නොසැලකිල්ලෙන් හෝ අනවධානයෙන් හෝ හිතාමතා හෝ රජයේ අයිතිවාසිකම්වලට හානිවන අයුරින් ක්‍රියාකිරීම හෝ එසේ කිරීමට ඉඩ හැර තිබුණු අතර ඒ පිළිබඳව ආයතන සංග්‍රහයේ II කොටස පරිදි කටයුතු කර නොතිබුණි. | මිළගණන් සමග සැපයුම් ආයතන වෙතින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් සංසංදනාත්මකව පරීක්ෂා කිරීමේදී අත්පිට මුදලට භාණ්ඩ ලබාගතහොත් සැලකියයුතු රාජ්‍ය මුදල් ප්‍රමාණයක් ඉතිරිකර ගත හැකි වන බැවින් තත් අවශ්‍යතාවය විආස වෙතින් මුදල් වැයකර මිලදීගැනීම සඳහා ඉදිරි කටයුතු සිදුකර ඇත. ප්‍රසම්පාදන ක්‍රියා පිළිවෙත සිදුකිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නිසිපරිදි ක්‍රියාවට නගා නොමැත. ඉදිරියේදී නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලියකට අනුව කටයුතු කිරිමට අදාල අංශ දැනුවත් කර ඇත. | කොටස අනුව කටයුතු කල යුතුය. |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කලමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ නේවාසිකාගාර අවශ්‍යතා නිසි ලෙස සැලකිල්ලට නොගෙන මිලදී ගත් රු.9,180,960ක් වූ ප්‍රාග්ධන උපකරණ වලින් රු.1,446,118 ක් වටිනා රෙදි සෝදන යන්ත්‍ර 3 ක් සහ ශීතකරණ 3ක් ඇතුළු තවත් භාණ්ඩ වර්ග 9 කට අදාල විදුලි උපකරණ උපයෝජනයකින් තොරව නිශ්කාර්යව ගබඩා කර තිබුණි. | රෙදි සෝදන යන්ත්‍ර සහ ශීතකරණ විදේශීය ශිෂ්‍ය නිලධාරීන් සහභාගිවීමට අපේක්ෂිත සංඛ්‍යාව අනුව මිලදී ගෙන ඇති අතර අපේක්ෂිත සංඛ්‍යාව නොමැති විම හේතුවෙන් ගබඩා තොගයේ රදවා ගෙන ඇත. රෙදි සෝදන යන්ත්‍ර 03 සහ ශීතකරණ 03 අවශ්‍ය අවස්ථා වලදී අලුත් වැඩියා කිරිමට ප්‍රමානවත් කාලයක් ගත වන බැවින් විදේශීය ශිෂ්‍ය නිලධාරීන් වෙත නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. | අවශ්‍යතාවය නිසිලෙස සැලකිල්ලට ගෙන මිලදීගත යුතුවීම. |

### 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කලමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නේවාසිකාගාර අවශ්‍යතා සඳහා ගෘහභාණ්ඩ මිලදී ගැනීමට විද්‍යාලය විසින් ඉදිරිපත් කල පිරිවිතරයන් සඳහා සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කල මිල ගණන් වල ඇතුළත් පිරිවිතරයන් ඇගයීමට ලක් කර නොමැතිව සැපයුම්කරුට අවශ්‍ය භාණ්ඩ සැපයීමට | තාඇක නිර්දේශය මත තත් අවශ්‍යතාවයන් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන අයදුම්පත් සකස් කර ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කිරීමට ප්‍රථම පරීක්ෂා නොකිරීම විෂය භාර ලිපිකරු අතින් සිදු වූ ප්‍රමාද දෝශයක් බැව් පෙන්වා දෙන අතර, මින් ඉදිරියට එවැනි | එකඟවූ පිරිවිතර වලට අනුව භාණ්ඩ භාර ගත යුතුවේ.ප්‍රසම්පාද න මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව |

| | | |
|---|---|---|
| අවස්ථාව සලසා දෙමින් රු.1,822,006 ක් වටිනා ඇණවුම ස්වර්ණ කැලුම් ආයතනය වෙත පිරිනමා තිබුණි. එහිදි මිලදී ගත් රු.350,250 ක් වටිනා කෑම මේස පුටු 30 කළු පැහැති වර්ණයෙන් යුක්ත වීමෙන් නේවාසිකගාර සඳහා එම වර්ණය නොගැලපෙන බැවින් උපයෝජනයකින් තොරව ගබඩාවේ නිෂ්කාර්යව පැවතිණි. එසේම මෙම ඇණවුම තුලින් එකතුව රු.565,300 ක් වටිනා ඇඳන් 5ක් සහ මෙට්ට 5 ක් පිරිවිතරයන්ට අනුකූල නොවීම හේතුවෙන් දෙසැම්බර් 28 වන දින එම භාණ්ඩ ආපසු හරවා යවා තිබුණු අතර සැපයුම්කරු විසින් ඉදිරිපත් කල රු.158,440 ක් වටිනා කාර්ය සාධන ඇපකරය දෙසැම්බර් 31 දින කල් ඉකුත් වී තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල වන පරිදි වැඩ නිමකල දිනය පසුවී දින 28 ක් දක්වා වලංගු වන පරිදි කාර්ය සාධන ඇපකරය ලබා නොගැනීම නිසා විද්‍යාලයට එය මුදල් කර ගැනීමට නොහැකි වී තිබුණි. | අතපසුවීම් නොකරන ලෙස තරයේ උපදෙස් ලබා දී ඇත. ඇඳන් 05 ක් සහ මෙට්ට 05ක් සැපයුම් කිරීමෙන් පසු නිසි ප්‍රමිතියකින් තොරව ඉදිරිපත් කර ඇති බැවින් තත්ව පරීක්ෂක නිලධාරී විසින් ප්‍රතික්ෂේප කර ඇති අතර, එම භාණ්ඩ නැවත නිවැරදි පිරිවිතරයට හා ඵලදායීව ලබා දෙන ලෙස කීප අවස්ථාවකම අදාල සැපයුම් ආයතනය දැනුවත් කලද මේ දක්වා කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොමැත. අදාල කාර්යසාධන සුරක්ෂණ ඇපබැදුම්කරය අවලංගුවීමේ දිනය 2022.12.31 දින වශයෙන් සඳහන් කර ලබා දී ඇති බැවින් මේවන විට අදාල කාලසීමාව අවලංගුවී ඇත. මින් ඉදිරියටද එවැනි ඇප බැදුම්කර ලබාගැනීමේදී නිසි පරිදි පරීක්ෂා කර ලබා ගන්නා ලෙස අංශභාර නිලධාරී වෙත උපදෙස් ලබා දී ඇත. | කාර්ය සාධන ඇපකර ලබාගත යුතුවීම. |
| (ආ) මාණ්ඩලික විද්‍යාලයේ අවශ්‍යතා සඳහා Heavy duty ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා 2022 ජනවාරි 26 වන දින පළමුවර ලංසු කැඳවා තිබුණද විද්‍යාලයේ අවශ්‍යතාවයට නොගැලපෙන පරිදි පිරිවිතර සකස් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ජූනි 28 වන දින තෙවන වරටත් ලංසු කැඳවා අදාල ඡායා පිටපත් යන්ත්‍රය රු.2,200,000 කට මිලදී ගෙන තිබුණි. නිවැරදි පිරිවිතර සකස් නොකිරීම නිසා ප්‍රසම්පාදන කටයුතු සඳහා ගතකල කාල ප්‍රමාදය හේතුවෙන් පළමුවර ලංසු කැඳවීමේදී රු.1,600,000 කට පැවති ඡායා පිටපත් යන්ත්‍රය තෙවන වර ලංසු කැඳවීමේදී රු.2,200,000 මිලදී ගැනීමෙන් මාණ්ඩලික විද්‍යාලයට රු.600,000 අලාභයක් සිදුවී තිබුණි | විෂයභාර ලිපිකරු අතින් සිදුවූ අතපසුවීමක් හේතුවෙන් විනාඩියකට ඡායා පිටපත් 70 (cpm) වශයෙන් ඉල්ලුම් කරන ලෙස භාණ්ඩ ඉල්ලුම් කිරීමේදී ලබා දී ඇති පිරිවිතරයේ සඳහන් වුවද සැපයුම් කරුවන් වෙතින් මිලගණන් පත් ඉල්ලුම් කිරීමේදි විනාඩියකට ඡායා පිටපත් 45 (cpm) වශයෙන් පිරිවිතරය සකස්කර ඉදිරිපත් කර ඇත. අදාල ඡායා පිටපත් යන්ත්‍රයේ කාර්යක්ෂමතාවය මිනිත්තුවකට කොළ 60 ක ප්‍රමාණයක් වන අතර, අඩු කාලසීමාවකදී වැඩි ඡායා පිටපත් ප්‍රමාණයක් ලබා ගැනීමට හැකියාවක් ඇති බවත්, දැනට ආසේඅමාවී භාවිතා කරනු ලබන Heavy Duty Digital Photocopy Machine Black & White යන්ත්‍රය වසර 07 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවට තාඇක මගින් පෙන්වාදී ඇති අතර, තත්වයෙන් හා කාර්යක්ෂමතාවයෙන් උසස්, භාවිතා කිරීමේදී ප්‍රතිඵලදායීතාවය මත අත්දැකීම් ඇති Konica Minolta යන්ත්‍රය මිලදීගැනීමට ප්‍රසම්පාදන කමිටුව මගින් නිර්දේශ කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව මිලදී ගැනීම් සිදු කල යුතුය. |

### 3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කලමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.මිලියන 133 ක් වැයකර ඉදිකරන ලද සිව් මහල් පුස්තකාල සහ විභාග ශාලා ගොඩනැගිල්ලේ ජල කාන්දු වීමේ ගැටළුව නිසා ඉහල මහලේ විදුලි පද්ධතියට හා බිත්ති වලට විශාල හානියක් සිදු වී පවතින අතර ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සිදු කිරීමට 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා නොහැකි වී තිබුණි. | ගොඩනැගිල්ලේ ජල නිවාරණ කටයුතු සිදු කිරීම පරික්ෂා කිරීම සඳහා යුද්ධ හමුදා ඉංජිනේරු සේවා අධ්‍යක්ෂක මණ්ඩල නියෝජිතයෙකු කැඳවා ඒ සඳහා අවැසි ඇස්තමේන්තු පතක් සකස් කර ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට මේවන විට කටයුතු සිදුකර ඇත. අදාල ඇස්තමේන්තු පත සඳහා ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් අනුමැතිය ලබා දීමෙන් පසු ජලනිවාරණ කටයුතු සඳහා අවැසි ද්‍රව්‍ය මිලදී ගැනීමට සහ සේවාව ඉටු කර ගැනීමට මෙම ගොඩනැගිල්ල ඉදිකරන ලද ආයතනය වෙත ගෙවීමට ඇති රඳවා ගැනීමේ මුදල (Retention Money) උපයෝගි කොට ගෙන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව මඟින් සිදු කිරීමට ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ | ඉදිකිරීම් නිවැරදිව කරවාගත යුතුය.ගොඩනැගිල්ලට හානි නොවන පරිදි අඩුපාඩු සකස් කරවා ගත යුතුය |

### 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කලමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාථමික පුරප්පාඩු 32 ක් ද්විතීක පුරප්පාඩු 9 ක් සහ තෘතීක පුරප්පාඩු 2 ක් පැවතුණි. | පුරප්පාඩුව පවතින තනතුර සඳහා කාර්යමණ්ඩලය බඳවාගැනීම අත්හිටුවීමට කටයුතු කරන ලෙස අමාත්‍ය මණ්ඩල තීරණ /චක්‍රලේක/ලිපි මගින් දන්වා ඇත. | පුරප්පාඩු පිරවීමට හෝ තත්‍ය කාර්ය මණ්ඩලයට ගැලපෙන ලෙස අනුමත සේවක සංඛ්‍යාව සමාලෝචනය කර ගැනීමට කටයුතු කල යුතුය. |